මගේ අංකය / எனது இல. / My No. } චක්‍ර 03/2010 - ප්‍ර.නො.10/30/82/10

ඔබේ අංකය / உமது இல. / Your No. }

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. } 2889488 / 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. } 2889491

ඊමේල් / மின்னஞ்சல் / Email } rgd@sltnet.lk / rg@rgd. gov.lk

වෙබ් අඩවිය / இணைய தளம் / Web site } www.rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. } 565

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Baththaramulla'

දිනය / திகதி / Date : 2010.06. 14

චක්‍රලේඛ අංක 03/2010

සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර් වරුන් වෙත.

## රජයේ ඉඩම් සඳහා නොතාරිස් ඔප්පු සකස්කිරීම.

මෑතක සිට රජයේ ඉඩම් සඳහා ව්‍යාජලෙස නොතාරිස් ඔප්පු සකස්කර ඉදිරිපත්කර ලියාපදිංචිකර ගන්නා බවත් එම හේතුව නිසා ඇතිවන විවිධ වංචාවන් සහ අපරාධ සම්බන්ධ බරපතල ප්‍රශ්ණ රැසකට මුහුණ දීමට සිදුවී ඇති බවත් විවිධ පළාත්වල රජයේ ආයතන වෙතින් මා වෙත නිතිර නිතර වාර්තා වෙමින් පවතී. එවැනි නීති විරෝධි ක්‍රියාවන් තවදුරටත් සිදු වීම වැලැක්වීම සඳහා මෙම දෙපාර්තමේන්තුවට ගතහැකි උපරිම ක්‍රියා මර්ගීයන් ගැනීම කාලීන මෙන්ම හදිසි ජාතික අවශ්‍යතාවයක් වී ඇත. එබැවින් ඔප්පු ලියාපදිංචි කිරීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් වන ලෙස දන්වමි.

(අ) ලියාපදිංචිය සඳහා ඔබ වෙත ලැබී ඇති ඔප්පුවේ සඳහන් ඉඩම හෝ ඉඩම් රජයේ ඉඩමක් නොවන බවට සෑහීමකට පත්වීමෙන් පසුව පමණක් ලියාපදිංචියට පියවර ගැනීම.

(ආ) එම ඉඩම රජයේ ඉඩමක් බවට යම් සැකයක් මතුවන්නේනම් එම ඔප්පුවේ පිටපතක්ද සමඟ වාහම අදාල ප්‍රදේශයේ ප්‍රාදේශිය ලේකම් වරයාගෙන් මේ ගැන විමසීමක් කිරීම.

(ඇ) ප්‍රාදේශිය ලේකම් වරයා විසින් එය රජයේ ඉඩමක් බව දැනුම් දුනහොත් එම ඔප්පුව ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීමටත් රජයේ ඉඩමක් නොවන බැව් දන්වා සිටිය හොත් එය ලියාපදිංචි කිරීමටත් පියවර ගැනීම.

02. ඉහත සඳහන් කරුණු කෙරේ විශේෂ අවධානය යොමුකරමින් ඔබගේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙසත් මෙම නියමයන්ට පටහැනිව කටයුතු කරණු ලැබුවහොත් ඒ සම්බන්ධයෙන් දැඩි විනයානුකුල ක්‍රියාමර්ගයක් ගැනීමට සිදුවන බවත් කරුණිකව දන්වාසිටිමි.

ජී.එම්.ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.
ජී. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්:- 1. සියළුම දිස්ත්‍රික් ලේකම් වරුන් /අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් වරුන් වෙත - ඔබගේ දැනගැනීම සඳහා

2. සියළුම කාලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනාරාල්වරුන් වෙත. - ඔබගේ දැනගැනීම සඳහා

3. පළාත් ඉඩම් කොමසාරිස් උතුරුමැද පළාත. - ඔබගේ යොමුව NCP/PLC/L8/10 පොදු